# නුවර කන්ද විහාරයේ ඓතිහාසිකත්වය

**කේ- එස්- එන්- කේ- කරුණාදාස**

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
saumya.jeewa@yahoo.com

---

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ව නැටිය ග්‍රාමනිලධාරි වසමේ නුවර කන්ද ඓතිහාසික විහාරස්ථානය පිහිටා තිබේ. මෙම විහාරස්ථානයට උතුරින් අමර-උදාගම, දකුණින් අමුණුගම, නැගෙනහිරින් දැදුරු ඔය, බටහිරින් නැටිය ග්‍රාමය පිහිටා තිබේ. ස්වාභාවික ගල්ලෙන් සහිත ව උස් බිමක පිහිටා ඇති මෙම විහාරස්ථානයට කටාරම් සහිත ලෙන් හයක් අයත් වේ. ඉන් ලෙන් තුනක පුරාවිද්‍යාත්මක ව වැදගත් සාධක හඳුනාගෙන තිබේ. ඒ අතර ප්‍රාග් බ්‍රාහ්මීය අක්ෂර සහිත ලෙන්, කෘත්‍රිම ව සකස් කළ ශිලා ඇඳන් ත්‍රිත්වයක්, ශිලාමය ඡත්‍රපත් සහ හර්මිකාවක කොටස් වේ. ඓතිහාසික වශයෙන් වැදගත් වන බිතුසිතුවම් ලෙන හා ශ්‍රී ලංකාවේ එකම දහයියා බුදුපිළිම සහිත ලෙන මෙම ස්ථානයට අයත් පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් සාධකයන් වේ.

මෙම පර්යේෂයේ මූලික පරමාර්ථ ලෙස නුවර කන්ද විහාරයේ ඓතිහාසිකත්වය සොයා බැලීම, පැරණි මානව විද්‍යාත්මක හා පුරාවිද්‍යාත්මක සාධක විමර්ශනය, බිතුසිතුවම් ලෙන හා දහයියා බුදුපිළිම ලෙනේ හායනකාරක හඳුනාගනිමින් සංරක්ෂණයට අවධානය යොමු කිරීම දැක්විය හැකි ය. තොරතුරු ලබා ගැනීමේ අපහසුතාවය, ජනප්‍රවාද නිසා පුරාවිද්‍යා සහ ඓතිහාසික සාධක යටපත් වී යාම, භෞතික බලපෑම් නිසා දත්ත විනාශ වී යාම හා සත්ත්ව ක්‍රියාකාරීත්වය, අනිසි ඉදිකිරීම් ආදිය පර්යේෂණය සීමා කරවීමට හේතු විය.

පර්යේෂණයෙහි අරමුණු සාධනය සඳහා නුවර කන්ද පිළිබඳ ලිඛිත මූලාශ්‍රය අධ්‍යයනය, පූර්ව පර්යේෂණ වාර්තා අධ්‍යයනය, ක්ෂේත්‍රගත අධ්‍යයනය, මානව වංශ දත්ත ලබා ගැනීම, ක්ෂේත්‍රගත ව හායනකාරක හඳුනාගනිමින් සංරක්ෂණය කළ යුතු ස්ථාන හඳුනාගැනීම ආදිය සිදුකරනු ලැබිණි. තව ම සිදුකෙරෙමින් පවතින මෙම පර්යේෂණයෙහි වර්තමානය වන විට ඓතිහාසිකත්වය සොයා බැලීම, මානව වංශ දත්ත ලබාගැනීම, සිතුවම් ලෙන් හා දහයියා බුදු පිළිම ලෙනේ හායනකාරක හඳුනාගැනීම සාර්ථක ව නිමවා තිබේ. නුවර කන්ද විහාරය මෙරට මුල් ඓතිහාසික යුගය දක්වා දිව යන මානව සාධක සහිත මෙන් ම කාලානුරූපී ව බොහෝ ඓතිහාසික සිදුවීම් සමග බැඳී පවතින සන්ධිස්ථානයක් වන බැවින් එම ස්ථානය සුරක්ෂිත ව පවත්වාගෙන යා යුතු බව මෙහි දී හඳුනාගනු ලැබිණි.

ප්‍රමුඛ පද : නුවර කන්ද, හායනකාරක, බිතුසිතුවම්, දහයියා බුදුපිළිමය, ලෙන්